**34 වන පිටෙන්**

රැයක් නිදිමරා සරාගී ලවන් වෙහෙසිලා..
යලිත් එනතුරා සුරංගී හිඳිමි මග බලා..
හෙටත් සඳ උදාවේ රැයත් පැමිණිලා..
සිහින ලොවට යාවී..සුරඹ මා සොයාවී..

1967 දී ගුවන් විදුලියේ සහන නිවේදකයකු ලෙස සේවයට එක් වී පසුව තැටි ගබඩා භාරකරු, වාචික වැඩ සටහන් පාලක, සිටි එෆ්. එම්. පාලක වශයෙන් විවිධ තනතුරු දරා ඇති කේ. ඩී. කේ. අවසාන කාලයේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පවත්වාගෙන ගිය ලාංකීය ගුවන් විදුලි සිංහල වැඩ සටහන් භාර ප්‍රධානියා ලෙස කටයුතු කරමින් උන්නා.

කවුද ලොවට අමතක වූ කේ. ඩී. කේ.

**ඇගෙ සිනහව තහනම්**
**ගෙදරින් මට තහනම්**
**සැළ වෙයි ගෙදරට**
**ඇය හමුවුණොතින්**
**චර පුරුෂයො දැන් මා වටලා...**

ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් ගැයු මහ වැස්සක පෙර නිමිති (මා දැන් මහලු වියේ), කුමරියක පා සළඹ ඒ වගේම විජී රත්න වරකාගොඩ ගැයූ මිහිරි සිහිනයක දැවටුණු ආචාර්ය වික්ටර් රත්නායකයන් ගැයු දිනෙක හිරු බැස යන - නීල බිඟු කැල - හෝපලු වන පෙත - සඳ හිරු පවතින තුරු - අපි උදේ ගිහිල්ලා වැනි හැත්තෑවේ දශකයේ වඩාත් ජනප්‍රිය වූ ගීත සංකල්පනාවන්ගේ හිමිකාරයා කේ. ඩී. කේ. ය. අද මානව පරිකල්පනය මොටකර මුලිනුපුටා දමන රූපයන්ත්‍රයේ ග්‍රහණයට ලක්වන්නට පෙරාතුව එදා ගුවන් විදුලිය මාධ්‍ය ට හුරුව සිටි රසිකයන්ගේ ගේ මනස සිසාරා දිවයන එවන් සුන්දර රූපාවලියක් මැවූයේ ද කේ. ඩී. කේ. ය

දිනක බන්දුල විජේවීරට ලැබෙන ගුවන් විදුලි සරළ ගිත වැඩසටහනක් පටිතග කරන්න නියමිතව තිබුණෙ ඊට පසු දවසේ. ඒ වන විටත් එක ගීයක් අඩුවෙලා ගීත දෙකක ගී තනු නිර්මාණය කරමින් පූර්ව පෙරහුරු කරමින් ඉන්න මොහොතක ගීත රචකයෙක් වගේම ගුවන්විදුලියේ විශිෂ්ඨ නිවේදකයෙක්ව හිටිය කේ.ඩී.කේ.



ධර්මවර්ධන ඒ වෙලාවෙ වික්ටර් රත්නායකයන්ගේ නිවසට පැමිණියා. බන්දුල විජේවීර තමන්ට ඊළග දවසේ පටිගත කිරිමට නියමිතව ඇති සරළ ගී වැඩ සටහන සඳහා ගීතයක් අඩු බව කියා කඩිනමින් ගීයක් ලියා දෙන ලෙස කේ.ඩී.කේ. ගෙන් ඉල්ලා සිටියත් ඒ මොහොතේ හදිස්සියේම ගිතයක් ලියන්න අදහසක් ගොනු කර ගැනිමට අපහසුව සිටි ඔහුගෙ දෑස ඒ නිවසේ මේසයක් මත තිබූ නවකතා පොතක් කෙරෙහි යොමුව තිබුණි. බන්දුල කේ. ඩී. කේ. ලවා කෙසේ හෝ ගීයක් රචනා කරදෙන ලෙස ඇවිටිලි කරන්න විය. තරමක කරදරයක් වූ නිසාවෙන්ද නිසිවන් ප්‍රස්තුතයක් නොතිබූ අවසථාවේ ගී පද රචනා කල නොහැකි බව කේ. ඩී. කේ. පැවසිය. අවසානයේ වික්ටර්ගේ පෙර බිරිද, අනේ මේ පොත බලලා හරි මතක් කර ගන්නා ලෙස ඉල්ලා සිටියා. නව කතාව ලියා තිබුණේ කරුණාසේන ජයලත් ය. පොතේ නම රිදී නිම්නය දුටු විගස කේ.ඩී.කේ.ට නවකතාවේ ඇතුළත් වූ කතා පුවත වහා වැටහුණේ ඔහු එම නවකතාව ඊට පෙර කියවා තිබූ නිසාය. කේ.ඩී.කේ. එසැණින් කඩදාසියක ලිව්වේ මේ ගීයයි.

**රිදී නිම්නය කඳුළු නිම්නය**
**ඔබය මගෙ ජීවිතයේ**
**නොදුටු නිම්නය ඔබය**
**මගෙ ජීවිතයේ**

**මී විතෙන් තොල් මත්ව යනවා**
**ඉන්ම හදවත සසල වෙනවා**

මිල්ටන්ට කේ. ඩී. කේ. ගීත සිය ගණනක් ලියා තියෙනවා. මිල්ටන් ගැයූ රණබර ඉඳුදුණු සිතුවම් වෙලා - සිහිනෙන් ඔබ මට පෙනෙනව නම් - මා හා එදා ප්‍රිය සාදයේ - සයුරු තෙරේදී - මට මෙන් ඔහුට ද කඳුළ ඔබයි - උපුල් කොපුල් වෙහෙසී ඇතේ - රන්මසු නැහැ කියා - ඉවුරු තලා ගංගා බැස යනවා - සිටු කුමාරියේ ඔබේ සිනා සඳළු තලාවේ - කෙසේ කියන්නද ඔබ මා අතහැර - නිරතුරු ඔබ ගැනම සිතන්නෙමි වැනි ගීත ගණනාවක්ම පද රචනා කේ. ඩී. කේ. ගේයි. මිල්ටන්ට ලියු අවසාන ගීතය ණීවීණා බිඟු වීණා ගීතයත් සැබෑ අත්දැකීමක් ඇසුරෙන් ලියු ගීතයක් බව කේ. ඩී. කේ. කියලා තියෙනවා.

**මගෙ හිත පිරී තිබෙන්නේ**
**ඔබ ගැන සිතිවිල්ලෙන්**
**වෙන කිසිවෙකු ගැන හිතන්න**
**හදවතට ඉඩක් නැහැනේ...**

ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී සිංහල සේවා අධ්‍යක්ෂ පාලිත පෙරේරා හා එක්ව සෙවණැල්ලක් මෙන් සිටිමින් සම්ප්‍රදායික ගතානුගතික එකී අයාතනය නවීණ ලෝකය වෙත කැන්දාගෙන යන්නට ඔහු ද අතහිත දුන්නේ ලාංකිය පුරෝගාමී එෆ් එම් චැනලය වූ සිටි එෆ් එම් බිහිකරන්නට දරදිය ඇදීමෙනි. කිසිදා ගරු බුහුමන් නොලැබූ ඔහු සදා නොඑන ගමන් ගියේ බොරැල්ලටය. කේ. ඩී. කේ. ආයි එන්න එපා...

**අප උදේ ගිහිල්ලා**
**යළි හවසට එනවා**
**ඒ අතරේ ඒ පැය අට**
**බොරුවෙන් ගත වේ නම්**
**අපත් එතැනමයි**
**රටත් එතැනමයි...**

ජීවත්ව සිටියදී කේ. ඩී. කේ. ධර්මවර්ධන මෙසේ ලියා තිබිණි.

**ගුණ ගී වරුසා පැසසුම් ඝෝෂා**
**රැව් දෙන්නේ මරණින් පස්සේ**
**කී දොස් නැවතී එතුවක් පැවතී**
**හොඳ මතුවේ මරණින් පස්සේ...**

අනේ අපි කවදාක හිනැහෙමුද ඒ රටේ ...
මෙතැන් සිට ඔබ අමතන මා කේ. ඩී. කේ. ධර්මවර්ධන

**26 වන පිටෙන්**

ගීතය 6
**වැලි තල අතරේ**




මහින්දාගමනයත් සමග සිංහල බෞද්ධයා ලද මාහැගි අග්‍රගන්‍ය වූත් පුණ්‍යවන්ත වූත් දායාදය වන්නේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ය.. අද එය ලොව ඇති ප්‍රමුඛ පූජණීය වෘක්ෂය බවට පත්ව ඇත්තේ ඒ හා බැඳි ගෞරවණීය පසුබිම හේතුකොටගෙනය.. මුල් ශ්‍රී මහා බෝධිය බුදුන් වහන්සේ සතියක් පුරා අනිමිස ලෝචන පූජාවෙන් පිදූවකි.. මහමෙවුනාවේ රෝපිත අපගේ ජය සිරිමා බෝ සමිඳුන්ගේ අසිරිය මහ බෝ වන්නමක් ලෙස චන්ද්‍රරත්න මා-නවසිංහයන් ගේ ගේය පදයෙන් අලංකෘතව විශාරද අමරදේවයන්ගේ මධුර භාෂණයෙන් මෙසේ ගීතවත් වෙයි.. ඒ පොසොන් ගීත සාහිත්‍යයේ විශිෂ්ටතම නිර්මාණයකි..

ගීතය 7
**වැදී සුගන්ධේ**

**වැදී සුගන්ධේ වෙලී සුළං හා පිපී රශ්මි මාලා**
**මිහින්තලා ගත දෙසින් පෙනේ ෂඩ් වර්ණ රශ්මි ධාරා**
**බුදුන් දහම් සිසිලේ - දිලේ දිලේ ලංකා**
**අදයි සුපින්වත් මහින්ද මා හිමි වැඩිය පොසොන් පෝදා**

**පින්බර මේ සෝ බා උතුම් පොසොන් පෝ දා**
**සිංහල ජාතිය සම්බුදු ධර්මය දිනේ සදා ලංකා//**

විශාරද නන්දාමාලිනී ගායිකාව විසීන් ලයාන්විතව ලගායනා කරන ලද මෙම ගීතය මිහින්තලාවෙන් පෑයූ ෂඩ්වර්ණය ශ්‍රී ලක්දිව දහම් සුවඳින් ඒකාලෝක කර ඇති ආකාරයත් සිංහල ජාතිය සම්බුදු සහම වැළඳගත් පො-සොන් දිනයේ වැදගත් කමත් ආවර්ජනය කරන්නකි.. එම සද්ධර්මයෙන් ජනිත උදාවෙන් සිංහල ජාතිය සදා සුරැකේවා යන ප්‍රාර්ථනයක්ද ගෙන එයි..

ගීතය 8
**සසර වසන තුරු**

හෙළ දෙරණේ ජාතික උරුමයනගේ අග්‍රඵලයක් වන්නේ රත්නමාලි සෑය හා ජය ශ්‍රීමහ බෝධියයි.. තිසා වැව හා සීගිරියද තවත් අංග වලින් ජාතික සම්පත් වන අතර ඒ සැම මහින්දාගමනයේ ස්වර්ණ ඵලයන් ය.. රත්නමාලි සෑ කිරණින් මහ බෝ සෙණත් මුල් කොට ගෙන පින් කෙතක්




බවට පත් වූ මේ රන් දෙරණෝ නිවන් දකින තුරු යළි ඉප-දෙන්නට වාසනාව හිමවේවා යන ගැඹුරු ප්‍රාර්ථනයෙන් මෙම ගතය සමන්විත වෙයි.. ඩෝල්ටන් අල්විස් ගේය පද රචක-යාගේ සාරගර්භ කවිත්වය ආචාර්ය ඩබ් ඩී අමරටදේ-වයන්ගේ මියුරැ ප්‍රභාෂ්වර හඟින් සම සංගීතයෙන් ජාතික අභිමාණී ශෝකයක්ෙ ස් රසික හවත් පිනවන නිර්මාණයන් බිහිවී ඇති අපූර්වත්වය අපට පසක් කරගත හැකිය..